## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**කොළඹ විශ්වවිද්‍යාලය**

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

**රාජගිරියේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයීය දේශීය වෛද්‍ය පීඨයේ නව බටහිර පර්යන්ත ගොඩනැගිල්ල දක්වා පවතින අභ්‍යන්තර මාර්ගය (ඉන්ටර්ලොක් අල්ලන ලද මාර්ගය) වැඩිදියුණු කිරීම.**

***UOC/CWP/WE2/12/2025/48/FIM/RD***

1. කොළඹ විශ්වවිද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවෙන් පහත විස්තර කර ඇති පරිදි රු. මිලියන 15 ක (බදු හැර) පිරිවැය ඇස්තමේන්තුගත කරන ලද **රාජගිරියේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයීය දේශීය වෛද්‍ය පීඨයේ නව බටහිර පර්යන්ත ගොඩනැගිල්ල දක්වා පවතින අභ්‍යන්තර මාර්ගය (ඉන්ටර්ලොක් අල්ලන ලද මාර්ගය) වැඩිදියුණු කිරීම - UOC/CWP/WE2/12/2025/48/FIM/RD** සඳහා අභිලාෂී යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| **කොන්ත්‍රාත්තුව** | **ලංසු ලේඛන කට්ටලයක් සඳහා ආපසු නොගෙවන ලංසු ගාස්තුව** | **කාල සීමාව** | **ඉංජිනේරු ඇස්තමේන්තුව** | **ලංසු සුරක්ෂණය** |
|---|---|---|---|---|
| **රාජගිරියේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයීය දේශීය වෛද්‍ය පීඨයේ නව බටහිර පර්යන්ත ගොඩනැගිල්ල දක්වා පවතින අභ්‍යන්තර මාර්ගය (ඉන්ටර්ලොක් අල්ලන ලද මාර්ගය) වැඩිදියුණු කිරීම UOC/CWP/WE2/12/2025/48/FIM/RD** | රු. 3,500 /= | දින 120 | රු. මි. 15 (බදු හැර) | රු. 150,000.00 |

මෙම වැඩ කොටස ප්‍රමාණ බිල්පත් (BOQ) සහ සැලසුම්වල විස්තර කර ඇති පරිදි කඩා ඉවත් කිරීම්, කැනීම් සහ පස් පිරවීම්, ඉන්ටර්ලොක් ගල් ඇල්ලීම, කානු පද්ධති ඉදි කිරීම සහ භූ දර්ශන නිර්මාණය (Landscaping) යන කාර්යයන්ගෙන් සමන්විත වේ. මෙම වැඩ බිම කොළඹ විශ්වවිද්‍යාලයේ රාජගිරිය දේශීය වෛද්‍ය පීඨයේ පිහිටා ඇත.

2. ලංසුකරණය **ජාතික තරඟකාරී ලංසු ප්‍රතිපත්තියට ( NCB)** අනුකූලව පවත්වනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරු අසාදු ලේඛනගත වී නොසිටිය යුතු අතර පහත සඳහන් යෝග්‍යතා සහ සුදුසුකම් නිර්ණායක සපුරාලිය යුතුය:

| අවශ්‍ය **CIDA** ලියාපදිංචිය | පසුගිය වසර **5** සඳහා සාමාන්‍ය වාර්ෂික ඉදිකිරීම් පරිමාව | මූල්‍ය සම්පත් | **පසුගිය වසර 5 තුළ ලැබූ මීට සමාන ස්වභාවයේ නිශ්චිත ඉදිකිරීම් පළපුරුද්ද** |
|---|---|---|---|
| C7, C6 සහ C5 ශ්‍රේණි මාර්ග ඉදිකිරීම් | > රු.මි. 15 | > රු.මි. 5 | අවම වශයෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස **පසුගිය වසර 5** තුළ සමාන ස්වභාවයකින් සහ සංකීර්ණතාවයකින් යුත් (රුපියල් මිලියන 15) **කොන්ත්‍රාත්තු 02 ක්** සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබීම. |

අභිලාෂී ලංසුකරුවන්ට මේ පිළිබඳ වැඩිදුර තොරතුරු **වැඩ ඉංජිනේරු හෝ නියෝජ්‍ය ලේඛකාධිකාරී / මූලධන කාර්‍යය හා සැලසුම්කරණ, කොළඹ විශ්වවිද්‍යාලය, අංක 94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03** යන ලිපිනයෙන් **(දුර. අංකය: 011 259 9761/ 011 259 9762)** ලබා ගත හැකි අතර වැඩ කරන දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 2.30** දක්වා **නියෝජ්‍ය ලේඛකාධිකාරී (මූලධන කාර්‍යය හා සැලසුම්කරණ) කාර්යාලයේදී** ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.

4. අභිලාෂී ලංසුකරුවන් හට එක් එක් ලංසු ලේඛන කට්ටලය සඳහා ඉහත දක්වා ඇති පරිදි ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් හා ප්‍රාග්ධන කාර්‍යය හා සැලසුම්කරණ අංශයේ නි. ලේඛකාධිකාරී වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2026.07.27 දින සිට 2026.08.10 දින දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා ඉංග්‍රීසි භාෂාවෙන් සකසන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ආපසු ගෙවනු නොලබන ගාස්තුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගිණුම් අංක 505170600013 ට ගෙවිය යුතුය. ලංසුකරුවන්ට ලංසු ලේඛන නිකුත් කෙරෙන්නේ ඉහත ගාස්තුව ගෙවූ ලදුපත ඉදිරිපත් කිරීමෙන් පසු පමණකි.

5. ලංසු විවෘත කළ දින සිට දින 77 දක්වා (2026.08.11) වලංගු විය යුතු වේ.

6. සියලුම ලංසු සමඟ කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ නමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ඕනෑම වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද නිකුත් කළ ඉහත දක්වා ඇති වටිනාකම සහිත ලංසු ඇපකරයක් (කොන්දේසි විරහිත ඒක්ෂණ බැංකු ඇපකරයක්) ඉදිරිපත් කළ යුතු අතර එය ලංසු විවෘත කළ දින සිට දින 105 දක්වා (2026.11.23) වලංගු විය යුතුය.

7. අත්සන් කර මුද්‍රා තැබූ ලංසු, ලංසු ලේඛන සමඟ ඇති ආකෘති පත්‍රවල ඉදිරිපත් කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු, "මුල් පිටපත" ලෙස පැහැදිලිව සඳහන් කර, "අනුපිටපත" ලෙස සඳහන් කරන ලද පිටපතක් හා ලංසු ඇපකරය සමඟ මුද්‍රා තැබූ ලියුම් කවරයක හෝ පැකට්ටුවක බහා ඉදිරිපත් කළ යුතුය. කැඳවන ලද ටෙන්ඩරයේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය. (ලංසු ඇපකරය මුල් ලංසු ලේඛනය සමඟ ඉදිරිපත් කළ යුතුය).

8. පූර්ව ලංසු රැස්වීම 2026.08.03 වන දින පෙ.ව. 10.00 ට රාජගිරියේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයීය දේශීය වෛද්‍ය පීඨයේ මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

9. අදාළ කාර්යයන් ඉටු කිරීමට බලපෑ හැකි වැඩබිමේ පවතින තත්ත්වයන්, පිවිසුම් මාර්ග සහ අනෙකුත් සියලුම අදාළ කරුණු පිළිබඳව අධ්‍යයනය කර අවබෝධයක් ලබා ගැනීම සඳහා වැඩබිම නිරීක්ෂණය කරන ලෙස ලංසුකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

10. ලංසුකරු විසින් වැඩබිම පරික්ෂා කරන ලද බව සනාථ කිරීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කර අත්සන් තබන ලද වැඩබිම් පරීක්ෂණ වාර්තාව ලංසු ලේඛනයට ඇමිණිය යුතුය.

11. මුද්‍රා තැබූ ලංසු පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිය. නැතහොත් 2026.08.11 දින පැය 14.30 ට හෝ ඊට පෙර විද්‍යාල මන්දිරයේ මූලධන කායීය හා සැලසුම්කරණ අංශ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැකිය. ලංසු භාර ගන්නා වේලාව අවසන් වීමෙන් පසු ලැබෙන කිසිදු ලංසුවක් පිළිගනු නොලැබේ.

12. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම කොළඹ 03, කුමාරතුංග මුනිදාස මාවතේ අංක 94 හි පිහිටි විද්‍යාල මන්දිරයේ මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණෙන ලෙස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

13. කිසිදු හේතු පැහැදිලි කිරීමකින් තොරව ඕනෑම ලංසුවක් පිළිගැනීමේ සහ ඕනෑම ලංසුවක් හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ බලය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා සතුවන අතර ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන හා ඒකාන්ත තීරණය වේ.

සභාපති,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,

කොළඹ විශ්ව විද්‍යාලය,

අංක 94,

කුමාරතුංග මුනිදාස මාවත ,

කොළඹ 03.